0265

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

**නර්තනය (භරත) I**
நாட்டியம் (பரதம்) I
Dancing (Baratha) I

**53 S I**

*පැය දෙකයි*
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය, **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** පන්ජකිරුත්තිය පරමානන්ද තාන්ඩවම් හඳුන්වන වෙනත් නමක් වන්නේ,
(1) ගෞරී තාණ්ඩවම් ය. (2) ආනන්ද තාණ්ඩවම් ය.
(3) තිරිපුර තාණ්ඩවම් ය. (4) ඌර්ත්තුව තාණ්ඩවම් ය.
(5) සංකාර තාණ්ඩවම් ය.

**2.** කතකලි නර්තනය සඳහා වේශ නිරූපනය කරන ශිල්පියා වන්නේ,
(1) කොණංකි ය. (2) කට්ටියකාරන් ය. (3) සෞට්ටික්කාරන් ය.
(4) විදූෂකන් ය. (5) නට්ටුවනාර් ය.

**3.** තාල දසප්‍රානන්හි ඇතුළත් 'ෂඩ්' මාර්ගවලින් එකක් වන්නේ,
(1) වාර්ත්තිකම් ය. (2) කලෛ ය.
(3) ප්ලුතම් ය. (4) පතාකම් ය.
(5) අතීතම් ය.

**4.** කණ්ඩකජාති අඩතාලම් මිස්රගදී සමග එක්වීමෙන් නිර්මාණය වන තාලම්හි එකතුව වන්නේ,
(1) 90 කි. (2) 98 කි.
(3) 108 කි. (4) 126 කි.
(5) 162 කි.

**5.** පදවර්ණම්හි පූර්වාංග කොටසට ඇතුළත් වන්නේ,
(1) පල්ලවි, චරණම් හා චරණස්වරම් ය.
(2) පල්ලවි, අනුපල්ලවි හා චරණම් ය.
(3) අනුපල්ලවි, මුත්තායිස්වරම් හා චරණම් ය.
(4) පල්ලවි, අනුපල්ලවි හා මුත්තායිස්වරම් ය.
(5) පල්ලවි, අනුපල්ලවි හා චරණස්වරම් ය.

**6.** 'සායි' යනුවෙන් හඳුන්වනු ලබන අභිනය කුමක් ද?
(1) ආංගික (2) වාචික (3) සාත්වික
(4) ව්‍යන්ජක (5) ආහාර්ය

**7.** දයාවීර සඳහා උදාහරණ ලෙස හඳුන්වන පුද්ගලයාගේ නම කුමක් ද?
(1) කර්ණ (2) සිද්ධාර්ථ (3) අර්ජුන
(4) සිබිචක්‍රවර්ති (5) ශ්‍රී රාමපිරාන්

[දෙවැනි පිටුව බලන්න

**8.** රෞද්‍ර රසයෙහි විරුද්ධ රසය වන්නේ,

(1) හාස්‍ය ය. (2) භයානක ය.
(3) ශෘංගාර ය. (4) ශාන්ත ය.
(5) අද්භූතම් ය.

**9.** අනුපිළිවෙලින් ත්‍රිකාල නිර්මාණම්හි කාල ප්‍රමාණයේ පිළිවෙල වන්නේ,

(1) මධ්‍යම, විලම්බ හා ධ්‍රැත (2) මධ්‍යම, ධ්‍රැත හා විලම්බ
(3) විලම්බ, ධ්‍රැත හා මධ්‍යම (4) විලම්බ, මධ්‍යම හා ධ්‍රැත
(5) ධ්‍රැත, විලම්බ හා මධ්‍යම

**10.** රිදී වර්ණයෙන් පමණක් ආභරණ පැළඳ කරනු ලබන ශාස්ත්‍රීය නර්තනය වන්නේ,

(1) මෝහිනි ආට්ටම් ය. (2) කුච්චිපුඩි ය. (3) ඔඩිසි ය.
(4) කතක් ය. (5) කතකලි ය.

**11.** ;;;;;; ත, දිං,ගි/ න තොම් ත, දිං, ගින/ තොම් ත, දිං ගින තොම්// යන්නෙහි පංචජාති 'ත දිං ගි න තොම්' සංකේතයෙන් ලිවිය යුතු ආකාරය වන්නේ,

(1) තකදිමි තකදිමි තකිට ලෙස ය. (2) තකිට තකිට තකදිමි ලෙස ය.
(3) තකදිමි තකදිමි තක ලෙස ය. (4) තකිට තකිට තකිට තකිට ලෙස ය.
(5) තකදිමි තකදිමි තකදිමි ලෙස ය.

**12.** 'පර්වත යදි' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

(1) ඩමරුග යදි ය. (2) මෘදංග යදි ය.
(3) විසම යදි ය. (4) සම යදි ය.
(5) ස්රොතෝවහ යදි ය.

**13.** ආත්මාස්ත වර්ගයට අයත් රසය කුමක් ද?

(1) අත්භූත රස (2) හාස්‍ය රස
(3) ශෘංගාර රස (4) කරුණා රස
(5) භයානක රස

**14.** තලිච්චේරි සෙල්ලිපි පිහිටා ඇති කෝවිල කුමක් ද?

(1) චිදම්බරම් (2) තිරුපති
(3) මදුරෙර මීනාක්ෂි අම්මන් කෝවිල (4) තන්ජෙයි පෙරුම් කෝවිල
(5) ශ්‍රී රංගම්

**15.** නාට්‍ය වේදිකා නිර්මාණය කරන ප්‍රභේදයන්හි 'විකිරුදම්' යනු

(1) වෘත්තාකාර ය. (2) ත්‍රිකෝණාකාර ය.
(3) සෘජුකෝණාස්‍රාකාර ය. (4) චතුරස්‍රාකාර ය.
(5) අර්ධ වෘත්තාකාර ය.

**16.** ප්‍රබල වීණා කලාකාරිනියක වූ වීනෙයි ධනම්මාල්ගේ මිණිබිරිය වූ නර්තන ශිල්පිනිය කවුද?

(1) ශ්‍රීමතී රුක්මණී දේවි අරුණ්ඩේල් (2) මයිලාපූර් ගෞරි අම්මාල්
(3) පන්දනෙ නල්ලූර් සබාරන්ජිතම් (4) අභිනය අරසි බාලසරස්වතී
(5) වෛජයන්තිමාලා

**17.** ස්තායී භාවහි 'විස්මය' යනු

(1) අකමැත්ත ය. (2) ආශ්චර්ය ය. (3) උත්සාහය ය.
(4) කෝපය ය. (5) වීර ය.

**18.** ජීවාත්මා හා පරමාත්මා අතර සම්බන්ධතාව විදහා දැක්වෙන භරත නර්තන අංගය වන්නේ,

(1) තිල්ලානා ය. (2) අලාරිප්පු ය. (3) පුෂ්පාන්ජලී ය.
(4) ජදීස්වරම් ය. (5) පදම් ය.

[තුන්වැනි පිටුව බලන්න

**19.** කණ්ණප්ප නායනාර්තුමා දෙවියන්ට දැක්වූ භක්තිය

(1) ලාවන්‍ය භක්ති වේ. (2) මධුර භක්ති වේ.
(3) මූර්ක භක්ති වේ. (4) සාක්කිය භක්ති වේ.
(5) වාත්සල්‍ය භක්ති වේ.

**20.** සාත්විික භාවහි 'අශ්රු' යනු

(1) කඳුළු සැලීමයි. (2) ක්ලාන්ත වීමයි. (3) වෙව්ලීමයි.
(4) කටහඬෙහි වෙනසයි. (5) දහඩිය දැමීමයි.

**21.** 'චෙකණ්ඩි' යනුවෙන් හඳුන්වනු ලබන සංගීත භාණ්ඩය කුමක් ද?

(1) කෛතාලම් (2) පරෛ (3) හක්ගෙඩිය (4) මද්දලය (5) සේමක්කලම්

**22.** මිස්‍ර චාපු තාලයට නිර්මාණය වී ඇති අලාරිප්පුහි ඇතුළත් 'තාරිතගිණ = ජෙම්,; ත ත රි ත ගි ණ ජෙම්,; = යනුවෙන් නිර්මාණය වන තීර්මාණ සොර්කට්ටුහි 'ජෙම්' සඳහා වන මුළු මාත්‍රා ගණන වන්නේ,

(1) 2 ය. (2) 3 ය. (3) 4 ය. (4) 5 ය. (5) 6 ය.

**23.** මන්ත්‍ර තන්ත්‍ර ක්‍රියා ඇතුළත් කුත්තු වන්නේ,

(1) වසන්තන් කුත්තු ය. (2) වඩමොඩි කුත්තු ය.
(3) තේන්මොඩි කුත්තු ය. (4) මගිඩි කුත්තු ය.
(5) වාසාප්පු කුත්තු ය.

**24.** 'අභිනව බෝජා' යන්නෙන් හඳුන්වනු ලැබූ රජතුමා වන්නේ,

(1) සේවප්ප නායක්කර් ය. (2) රගුනාථ නායක්කර් ය. (3) සරබෝජි ය.
(4) විජයරාගව නායක්කර් ය. (5) මහේන්ද්‍ර වර්මන් ය.

**25.** පහත සඳහන් ඒවායින් ග්‍රාමීය නර්තනයක් **නොවන්නේ,**

(1) කුච්චිපුඩි නර්තනය ය. (2) ඔයිලාට්ටම් ය. (3) බොම්මලාට්ටම් ය.
(4) ඒන්දල් නර්තනය ය. (5) මයිලාට්ටම් ය.

**26.** වේදිකාවේ නිශ්චිත ස්ථානයක් කේන්ද්‍රගතව ආලෝකවත් කිරීම

(1) කීට්ටෘ ඔළි වේ. (2) වර්ණ ඔළි වේ.
(3) කුවින්ද ඔළි වේ. (4) පරප්පු ඔළි වේ.
(5) අසෛයුම් ඔළි වේ.

**27.** භරතමුණි විසින් සංස්කෘත භාෂාවෙන් රචිත ග්‍රන්ථය වන්නේ,

(1) භරත සොනාදිපතියම් ය. (2) අභිනයධර්පණම් ය.
(3) අභිනය සාරසම්පුටම් ය. (4) භරත සංග්‍රහම් ය.
(5) නාට්ටිය ශාස්ත්‍රම් ය.

**28.** සිලප්පදිකාරම්හි 'තණ්නුමෙෙ වාසිප්පෝන්' පිළිබඳව කියවෙන කාදෙෙ වන්නේ,

(1) කඩලාඩු කාදෙෙ ය. (2) අරංගේට්ටෘ කාදෙෙ ය.
(3) කානල්වරි ය. (4) නාඩුකාණ් කාදෙෙ ය.
(5) ඉන්ද්‍රවිලා එඩුත්ත කාදෙෙ ය.

**29.** ;;;;;; ත දිං/, ගි න තොම් ත දිං, ගි/න තොම් ත දිං, ගි න තොම්// යන තාලයේ නිර්මාණය විය හැකි 'ත දිං ගි න තොම්'// අඩව්වෙහි ජාති වන්නේ

(1) තිස්රම් වේ. (2) මිස්රම් වේ. (3) කණ්ඩම් වේ.
(4) චතුස්‍රම් වේ. (5) සංකීර්ණම් වේ.

**30.** අභිකුණ්ඨිකාව (කුරත්ති) 'වන්ජිකොඩි' යනුවෙන් ඉස්මතු කිරීම

(1) යක්ෂගානම් වේ. (2) බාමාකලාපම් වේ. (3) භාගවතමේලා වේ.
(4) කුට්ට්‍රාල කුරවන්ජි වේ. (5) ප්‍රකලාද චරිතම් වේ.

**31.** අභ්‍යාසලාභියෙකු විසින් නර්තනය කරනු ලබන ආරම්භක කොටස වන 'මුල් මාත්‍රා' ඇතුළත් නර්තන සම්ප්‍රදාය වන්නේ,

(1) රුහුණු නර්තනයයි. (2) වෙස් නර්තනයයි. (3) සබරගමු නර්තනයයි.
(4) උඩරට නර්තනයයි. (5) මඩු නර්තනයයි.

**32.** හත්දෙනෙකු හෝ අටදෙනෙකු එක්රුස් වී නර්තනය කිරීම,

(1) කුත්තු වේ. (2) කුරවෛ වේ. (3) පේඩියාඩල් වේ.
(4) වෙරියාට්ටු වේ. (5) පාවෛයාඩල් වේ.

**33.** නර්තනයෙහි අඳුරු යුගය ලෙස සලකනු ලැබුවේ,

(1) ඉංග්‍රීසි යුගයයි. (2) පල්ලව යුගයයි. (3) චෝල යුගයයි.
(4) මරාට්ටියර් යුගයයි. (5) නායක්කර් යුගයයි.

**34.** 'මගලිර් ත ලී ඉය තුණංගෛ යානුම්...' යනුවෙන් තුණංගෛ කුත්තු ඉස්මතු කර පවසන සංග යුගයේ සාහිත්‍ය වන්නේ,

(1) මධුරෛකාන්ජි ය. (2) පෙරුම්පාණාටෟප්පඩෛ ය.
(3) පදිට්ටුප්පත්තු ය. (4) කුරුන්තොගෛ ය.
(5) පරිපාඩල් ය.

**35.** ලේස් එම්බ්‍රොයිඩර් සහිත සුදු සාරිය ඇඳ, හිස මත දකුණට ඇලකර කොණ්ඩය බැඳ, එහි සුදුමල් තබා කරනු ලබන ශාස්ත්‍රීය නර්තනය වන්නේ,

(1) භරත නාට්‍යම් ය. (2) කතක් ය. (3) කතකලි ය.
(4) කුච්චිපුඩි ය. (5) මෝහිනී ආට්ටම් ය.

**36.** නායක සමග කෝපයෙන් සිටින නායිකාව සමාදාන කිරීමේ විශේෂඥයා වන්නේ,

(1) විඩන් ය. (2) සේඩන් ය. (3) පීඩමර්තන් ය.
(4) විදූසකන් ය. (5) චඩන් ය.

**37.** ශ්‍රී ලංකාවේ කලාකරුවන්ට 'කලාභූෂණ' සම්මානය ප්‍රදානය කර ගෞරව කරනු ලබන්නේ,

(1) ජනාධිපති ලේකම් කාර්යාලය විසිනි. (2) ශ්‍රී ලංකා රජය විසිනි.
(3) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසිනි. (4) සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසිනි.
(5) විදේශ කටයුතු අමාත්‍යාංශය විසිනි.

**38.** එකම ලීයෙන් කුඩම් සහ තණ්ඩි කැටයම් කරන ලද වීණාව හඳුන්වනු ලබන්නේ,

(1) රාවණ වීණාව ලෙසිනි. (2) ඒකාන්ත වීණාව ලෙසිනි.
(3) ආහාර වීණාව ලෙසිනි. (4) බ්‍රහ්ම වීණාව ලෙසිනි.
(5) කෝෂකා වීණාව ලෙසිනි.

**39.** 'එළිනි' යනුවෙන් වේදිකාවෙහි තිරය හඳුන්වන මහා ග්‍රන්ථය (කාප්පියම්) වන්නේ,

(1) සීවකසින්තාමනී ය. (2) මනිමේකලෛ ය. (3) වලෛයාපති ය.
(4) කුණ්ඩලකේසි ය. (5) සිලපතිකාරම් ය.

**40.** "එට්ට නිල්ලුමෙන්ඩඃ සොල්ලඩි - සකියේ, තොට්ටනෛක්කුම් වේලන් කිට්ට වන්දාල් - අවනෛ...." යන ගීතිකා පේළි මඟින් හෙළිදරව් කරනු ලබන අෂ්ටවිධ නායිකා වන්නේ,

(1) කණ්ඩිතා ය. (2) ස්වාධීනපන්ද්‍රිකා ය. (3) වාශකශජ්ජිකා ය.
(4) අභිශාරිකා ය. (5) විප්‍රලප්තා ය.

- ප්‍රශ්න අංක **41** සිට **45** දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ඇසුරින් වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

| තාණ්ඩවම් | අඟවනු ලබන ක්‍රියාව | රඟ දක්වනු ලබන ස්ථානය | විදහා දැක්වෙන සංකේතය | දාර්ශනික සංජානනය |
|---|---|---|---|---|
| කාලි තාණ්ඩවම් | මැවීම | තාම්‍ර සභෙ | උඩක්කිය | **E** |
| ගෞරිකා තාණ්ඩවම් | රැක ගැනීම | සිට් සභෙ | **D** | සියලු සම්පත් ලබා දී රැක ගැනීම |
| **A** | විනාශ කිරීම | **C** | අග්නි | ආත්ම සන්සුන් කිරීම |
| ත්‍රිපුර තාණ්ඩවම් | **B** | චිත්තිර සභෙ | බිම තබා සිටින දේව පාදය | ඉරුවිනෙෙ ඔප්පු, මලපරිපාගම් ඇති කරයි. |
| ඌර්තුව තාණ්ඩවම් | ආශිර්වාද කිරීම | ඉරත්තින සභෙ | එසවූ දේව පාදය | ත්‍රිමලම් (මුම්මලම්) ගෙන් ආත්මය නිදහස් කරයි |

**41.** **A** හි සඳහන් විය යුතු තාණ්ඩවම් වන්නේ,
(1) මුනි තාණ්ඩවම් ය.
(2) සංකාර තාණ්ඩවම් ය.
(3) ආනන්ද තාණ්ඩවම් ය.
(4) සන්ධ්‍යා තාණ්ඩවම් ය.
(5) සන්ඩ තාණ්ඩවම් ය.

**42.** **B** හි සඳහන් විය යුතු ක්‍රියාව වන්නේ,
(1) සැඟවීම ය.
(2) සිනාසීම ය.
(3) පයින් ගැසීම ය.
(4) කෝපවීම ය.
(5) ලබාදීම ය.

**43.** **C** හි සඳහන් විය යුතු ස්ථානය වන්නේ,
(1) කෛලායම් ය.
(2) පොතිකෙ ය.
(3) සුඩලෛ ය.
(4) ඉමයම් ය.
(5) වඩගිරි ය.

**44.** **D** හි සඳහන් විය යුතු සංකේතය වන්නේ,
(1) පූනූල් ය.
(2) නයා ය.
(3) ඇස් තුන (මුක්කන්) ය.
(4) උමත්තම් මල ය.
(5) අභයකරම් ය.

**45.** **E** හි සඳහන් විය යුතු දර්ශනය වන්නේ,
(1) හොඳ සහ නරක (ඉරුවිනෛ) බැහැර කිරීම.
(2) ලෞකික සැප සම්පත් ලබා දීම.
(3) අසීමිත ශක්තිය වැඩි දියුණු කිරීම.
(4) ධනු, කරණ, පුවන, බෝග මැවීම.
(5) අප්‍රමාණ ප්‍රඥාව ප්‍රකාශ කිරීම.

**46.** මෙම රූපයේ දැක්වෙන නර්තන ප්‍රභේදය කුමක් ද?



(1) කුදිරෛ ආට්ටම් ය.
(2) මයිලාට්ටම් ය.
(3) කෝලාට්ටම් ය.
(4) මානාට්ටම් ය.
(5) පුලියාට්ටම් ය.


**47.** මෙම රූපයේ දැක්වෙන ස්ථානක භේදය කුමක් ද?

(1) ඒකපාදම්
(2) ගාරුඩම්
(3) සමපාදම්
(4) අයින්ද්‍රම්
(5) බ්‍රම්මහස්ථානම්




**48.** මෙම රූපයෙහි දැක්වෙන සංගීත භාණ්ඩයේ නම කුමක් ද?

(1) තවිල්
(2) තප්පු
(3) පරෙ
(4) මෘදංගම්
(5) මද්දලය



**49.** මෙම රූපයෙහි දැක්වෙන භරත නාට්‍ය ආභරණය කුමක් ද?

(1) නෙට්ට්‍රිචරි
(2) සූර්ය පිරෙ
(3) ඉරාක්කොඩි
(4) නත්තු
(5) මුත්තුප්පදක්කම්



**50.** මෙම රූපයෙහි දැක්වෙන ශාස්ත්‍රීය නර්තනය කුමක් ද?

(1) කතක්
(2) කතකලි
(3) ඔඩිසි
(4) උඩරට නර්තනය
(5) කුචිපුඩි



* * *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

නර්තනය (භරත) II
நாட்டியம் (பரதம்) II
Dancing (Baratha) II

53 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**
※ **I** කොටසේ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **දෙකක්** ද **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) ඔබ ඉගෙන ගත් පදවර්ණම්හි, රාගය සහ තාලය සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(ii) ඉහත ඔබ සඳහන් කර ඇති පදවර්ණම්හි ගී පද රචකයාගේ සහ නැටුම් නිර්මාණ ශිල්පියාගේ නම් සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(iii) ඉහත සඳහන් කළ පදවර්ණම්හි, මුත්තායිස්වර කෝර්වෙ එකක්, තාල අංග සංකේත සමග ලියන්න. (ලකුණු 06යි.)

(iv) ඉහත සඳහන් කළ පදවර්ණම්හි පළමුවන තීර්මාණම් තාල අංග සංකේත සමග ලියන්න. (ලකුණු 10යි.)

**2.** (i) මණිපුරි නර්තනයෙහි ආරම්භය පිළිබඳව කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 03යි.)

(ii) මණිපුරි නර්තනයෙහි භාවිත වන සංගීතය සහ සංගීත භාණ්ඩ පිළිබඳ සඳහන් කරන්න. (ලකුණු 03යි.)

(iii) මණිපුරි නර්තනයෙහි ඇඳුම් සහ ආභරණ පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 04යි.)

(iv) මණිපුරි නර්තනයෙහි නර්තන ක්‍රම පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 05යි.)

(v) මණිපුරි නර්තනය සංවර්ධනය වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)

**3.** (i) වාචික අභිනයෙහි වර්ග **හතර** සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(ii) ඉහත (i) හි සඳහන් කළ වාචික අභිනයෙහි වර්ග කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04යි.)

(iii) නාට්‍ය ශාස්ත්‍රයෙහි සඳහන් වන වේදිකාව (අරංගම්) පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 07යි.)

(iv) නර්තන කාන්තාවන්ගේ ඇඳුම් තෝරාගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු විස්තර කරන්න. (ලකුණු 07යි.)

[ දෙවැනි පිටුව බලන්න.

## II කොටස

**4.** (i) වේත්තියල් සහ පොතුවියල් අතර ඇති වෙනස්කම් සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(ii) සංගමරුවිය යුගයේ දී රඟ දක්වන ලද පහත සඳහන් නර්තන පිළිබඳව විස්තර කරන්න.

(අ) වරික්කෝලම් (ලකුණු 04යි.)

(ආ) ආයිච්චියර් කුරවෛ (ලකුණු 04යි.)

(ඉ) සාක්කෙයර් කූත්තු (ලකුණු 05යි.)

(iii) සිලප්පදිකාරම්හි සඳහන් වන සංගීත ගුරුවරයා සතු ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)

**5.** (i) පහත සඳහන් කූත්තු වර්ග පිළිබඳව විස්තර කරන්න.

(අ) පරෛමේල කූත්තු (ලකුණු 03යි.)

(ආ) තෙන්මෝඩි කූත්තු (ලකුණු 03යි.)

(ii) පහත සඳහන් කඳුරට කූත්තුවල වස්තු විෂය සහ වේදිකාව සකස් කිරීම පිළිබඳව විස්තර කරන්න.

(අ) කාමන් කූත්තු (ලකුණු 03යි.)

(ආ) අර්චුනන් තපසු (ලකුණු 03යි.)

(iii) මන්නාරම් ප්‍රදේශයේ නර්තනය කරනු ලබන කූත්තු වර්ග **දෙකක්** නම් කර, ඒවායින් එකක් පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 08යි.)

**6.** (i) තන්ජෙයි සු. පොන්නයියාතුමාගේ ජීවන තොරතුරු කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10යි.)

(ii) කලාවේ වර්ධනයට ඔහු දැක්වූ සේවා පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

**7.** මාර්ගගත (Online) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය හේතුවෙන් නර්තන ප්‍රායෝගික විෂයට බලපා ඇති වාසි සහ අවාසි පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 20යි.)

**8.** පහත සඳහන් කරුණු පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) උත්ප්ලවන බේදම්

(ii) රුහුණු නර්තනය

(iii) මද්දලය

(iv) විප්‍රයෝග ශෘංගාරය (ලකුණු 05×4=20යි.)

* * *